# වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදනය හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

### ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයට අයත් කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019/2020

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණියේ තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**(1) වැටුප් පරිමාණය :**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 යටතේ MN 3-2016 වැටුප් පරිමාණය අනුව රු.31,040-10X445-11X660-10X730-10X750-57,550/=

**(2) තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

අයදුම්කරුවන් ලිඛිත විභාගයකට යොමු කරන අතර එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්, එම විභාගයේ දී විෂයන් දෙක සඳහාම ලබා ගත් මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**(3) අයදුම් කිරීම :**

ඉල්ලුම්පත්‍රය, **www.agrariandept.gov.lk** වෙබ් අඩවියේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව ඒ4 කඩදාසියේ (21cmx29 cm) දෙපැත්ත භාවිත කරමින් සකස් කර අපේක්ෂකයා විසින් තම අත් අකුරෙන් ම පිරවිය යුතුය. අයදුම්පත්‍ර 2020.11.13 දින හෝ ඊට පෙර ලැබෙන සේ **"ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, තැ.පෙ. 537, කොළඹ 07"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **" ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී, III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2019/2020 "** ලෙස සඳහන් කළ යුතුය. අපේක්ෂකයා/ අපේක්ෂිකාව තමා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු සඳහා **www.agrariandept.gov.lk** වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**ඩබ්. එම්. එම්. බී. වීරසේකර**
**ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,**

**2020 ඔක්තෝබර් මස 16 දින**
**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,**
**තැ. පෙ. 537,**
**කොළඹ 07.**